# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 435/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 12/03/2024 පැය 0630

**මාධ්‍ය නිවේදනය**

**ක්‍රීඩා තරඟයක් අතරතුර පාසල් සිසුවෙකු මියයාමක් - තිරුක්කෝවිල් පොලිස් වසම.**

2024.03.11 වන දින උදෑසන කාලයේදී තිරුක්කෝවිල් පොලිස් වසමේ පිහිටි විද්‍යාලයක පැවති මැරතන් තරඟයක් අතරතුර තරඟයට සහභාගී වූ එම විද්‍යාලයේ සිසුවෙකු හදිසි අසනීප තත්ත්වයක් හේතුවෙන් තිරුක්කෝවිල් රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා අක්කරපත්තුව රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මියගිය සිසුවා වයස අවුරුදු 16ක් වන තුරෙය්යප්පා පාර, තිරුක්කෝවිල් 03 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අසනීප වූ සිසුවාට තිරුක්කෝවිල් රෝහලේදී නිසි ප්‍රතිකාර නොකළ බව පවසා ප්‍රදේශවාසීන් විසින් රෝහල් කාර්ය මණ්ඩලයට විරුද්ධව උද්ඝෝෂණයක්ද සිදුකර ඇති අතර, පොලිස් නිලධාරීන් විසින් කරුණු පහදා දීමෙන් අනතුරුව පිරිස විසිර ගොස් ඇත. මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අම්පාර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**